ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 9th April 2021.

පැමිණිලි පාර්ශවය : එම්. සුනිල් අබේධීර මයා.
බී./511/2. ඕවිටිගම.
වහරක.

වගඋත්තර පාර්ශවය : 01. ප්‍රාදේශීය ලේකම්.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.
රුවන්වැල්ල.

02. සභාපති.
ප්‍රාදේශීය සභාව.
රුවන්වැල්ල.

<u>පැමිණිලි අංකය : **HRC/5069/16**</u>

පැමිණිල්ලෙන් දක්වා ඇති කරුණු :-

කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වහරක ප්‍රදේශයේ ඕවිටිගම ග්‍රාමයේ ගෝනගල්දෙණිය යන ස්ථානයේ පිහිටි රක්ෂිත භූමියක පිහිටුවා ඇති ව්‍යාපාරික ස්ථානයක් හේතුකොටගෙන යාබද අත්තනගලු ඔයේ සංවේදී බිම් කලාපයට සිදුවන පාරිසරික හානි පිළිබඳ දක්වා සිටින පෙත්සම්කරු එකී පාරිසරික හානි සිදුවීමෙන් පෙත්සම්කාර තමාට මෙන්ම පොදුවේ සියළු ගම් වැසියන්ට සිදුවන ගැටළු හා දුෂ්කරතාවයන් දක්වමින් පාරිසරික අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා මෙම පැමිණිල්ල ගොනු කර ඇත. වගඋත්තරකරුවන් වෙත කරන ලද කරුණු දැක්වීම් වෙත සාධාරණ අවධානයක් යොමු නොකර තිබීම හා අභියාචනා නොසලකා හැරීම පිළිබඳව පැමිණිල්ලෙන් වැඩිදුරටත් දක්වා ඇත.

මෙම රක්ෂිත බිම් තීරුවට අදාලව තාවකාලිකව පදිංචි වීමේ අවසර පත්‍රයක් වාර්ෂික බදු පදනම මත හසිත මදූෂාන් සහ ජගත් හේමන්ත යන දෙදෙනා වෙත වගඋත්තරකරුවන් විසින්


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.c
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ලබාදී ඇති අතර. අත්තනගල්ල ඔයේ රක්ෂිත කලාපය ගොඩකර තිබීමෙන් ජලය ගලා යාමේ ස්වභාවය හා හැඩය වෙනස් වී අවහිර කර තිබීමෙන් පළමු අවස්ථාවේම පෙත්සම්කරු වගඋත්තරකාර ප්‍රාදේශීය ලේකම් වෙතද දළුවලාන ග්‍රාම නිලධාරී වෙත ද කරුණු දක්වා තිබී ඇති බව පෙත්සමෙන් දක්වා ඇත. එහෙත් ඒ වෙත සාධාරණ සවන් දීමක් සිදු නොවීමේ හේතුව මත දිගින් දිගටම පාරිසරික හානි සිදු කරමින් රක්ෂිතයේ තාවකාලිකව පදිංචි වීමට බලපත්‍ර ලබාගත් තැනැත්තා කටයුතු කර ඇති බව පෙන්වා දී ඇත.

පසුව දේපලේ රුදී සිටින්නන් විශාල යන්ත්‍රෝපකරණ භාවිතා කරමින් ඔය දෙපස පස් හා ගල් දමා අවහිර කරමින් අත්තනගල්ල ඔයේ අඩි 30ක් පමණ වූ නියමිත පළල ප්‍රමාණය අඩි 10 දක්වා අඩු කර ඇති බව ද රක්ෂිතයක තිබියයුතු ආරක්ෂාව නොතකා කටයුතු කරන බව ද පෙත්සම්කරු මෙන්ම ප්‍රදේශවාසීන් විසින් ද අත්සන් තබා ලිඛිතව ප්‍රාදේශීය ලේකම් වෙත දක්වා තිබියදී ප්‍රදේශවාසීන්ගේ විරෝධතා මත 2016.01.03 දින හෝ ආසන්න දිනක අනවසර කටයුතු ඉවත් කර ගල් හා පස් දමා අත්තනගල්ල ඔය අවහිර කර තිබීම ඉවත් කරන ලෙස දන්වා තිබී ඇති බව සඳහන් කර ඇත. ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරියද පරිසර අධිකාරිය වාරිමාර්ග දෙපාර්තමේන්තුවද රුවන්වැල්ල පොලිසියද සහභාගී වෙමින් ස්ථානීය පරීක්ෂණ සිදු කළද දේපලේ රුදී සිටින තැනැත්තන් දේශපාලනඥයින්ගේ සහාය ලබාගනිමින් එසේ ස්ථානීය පරීක්ෂණ සිදු කර ඉහත කී රාජ්‍ය ආයතන වෙතද බලපෑම් කරමින් තවදුරටත් ගල් හා පස් ඉවත් කිරීමට ලද නියෝග ක්‍රියාත්මක කිරීම පැහැරහරිමින් කටයුතු කරන බව ද පෙත්සමෙන් දක්වා ඇත.

ඒ අනුව මෙම ප්‍රදේශයටම ආවේණික පාරිසරික පද්ධතිය විනාශ වී යාමේ සංවේදී පරිසර කලාපයක් මගින් හිමිවන පාරිසරික අයිතිවාසිකම අහිමි වන බවට පෙත්සමෙන් දක්වමින් ප්‍රදේශ වාසීන් ඉන් විවිධ වූ දුෂ්කරතා හා ගැටළු රාශියකයකට මුහුණ දී ඇති බව ද ඊට හේතුව වී ඇත්තේ වගඋත්තරකරුවන් විසින් කරන ලද නොසලකා හැරීම් වන බැවින් පෙත්සම විභාග කර ඉල්ලා ඇති සහන ලබාදෙන ලෙසද දක්වා ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

මෙම පෙත්සමට අදාළව කරන ලද විමසීමේදී වගඋත්තරකරුවන් පහත පරිදි කරුණු දක්වා ඇත.

2015.06.29 දින රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් විසින් රක්ෂිතයේ රුදී සිටින්නන්ට අනවසරයෙන් පදිංචිව අත්තනගල්ල ඔය අවහිර කිරීම නතර කරන ලෙසට ලිඛිතව දන්වා ඇති බවත්. 2015.08.08 දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණ පරීක්ෂණයකට සහභාගී වන ලෙසද දන්වා ඇති බවත් සඳහන් කර ඇත. එහි යොමු අංකය RWN/LAN/MISEL/A2/96 වේ.

2016.02.29 දින ප්‍රාදේශීය ලේකම් විසින් අංක : කෑ/රුව/101ජ්/01 දරණ වාර්ෂික බදු බලපත්‍රයට අදාල බිම් කොටසේ වාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාමෙන් පසු අත්තනගල්ල ඔයට පස් පුරවා ගල් දමා ඇති බැවින් ඒවා ඉවත් කර ගන්නා ලෙසත් එසේ

නොවත්තේ නම් බලපත්‍රය අවලංගු කරන බවත් දන්වා ඇති බව සඳහන් කර ඇත. එහි යොමු අංකය :RWN/LAN/MISEL/A2/96-2 වේ.

2016.02.29 දින ප්‍රාදේශීය ලේකම් විසින් 'ඇල රක්ෂිතයේ පදිංචි බදුකරුගේ ක්‍රියාකාරකම් පිළිබඳ විවිධ රාජ්‍ය ආයතන ගණනාවක් සමග කළ පරීක්ෂණ වලට අනුව බලපත්‍රය සංශෝධනය කර ලබාදීම සුදුසු බවද කරන ලද හානි ඉවත් කිරීමට දැන්වීම සුදුසු බවද' කෑගල්ල අතිරේක දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා ඇත.

2016.06.28 දින තම අංක :RWN/LAN/MISEL/A2/96-2 යටතේ ප්‍රාදේශීය ලේකම් විසින් බදුකරු විසින් කරන ලද දැන්වීම ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් බලපත්‍රය සංශෝධනය කළයුතු බැවින් ඊට අදාළ පියවර ගන්නා ලෙසද පදිංචිකරුට ඒ බව දන්වන ලෙසද අදාල ග්‍රාම නිලධාරී වසම වූ දළුවලානේ ග්‍රාම නිලධාරී වෙත දන්වා ඇත.

2016.08.09 වන දින කෑගල්ල අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) විසින් රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් වෙත කරුණු දක්වා රක්ෂිතයේ පදිංචිකරු සිදු කරන ක්‍රියාවන් හේතුවෙන් අත්තනගලු ඔයේ ශාඛාව මළ දොළක් බව දක්වා ඉන් යාබද පදිංචි කරුවන්ගේ නිවාස වලට හානි සිදුව ඇති බව ද පෙන්වා දෙමින් ගතහැකි පියවර පිළිබඳ 2016.08.16 දින වාර්තාවක් දිස්ත්‍රික් පරිසර කමිටුවට ඉදිරිපත් කරන ලෙස දක්වා ඇත.

2016.08.15 දින ප්‍රාදේශීය ලේකම් විසින් කෑගල්ල දිස්ත්‍රික් ලේකම් වෙත ලියා දක්වා ඇත්තේ වාර්ෂික බලපත්‍ර මත රැඳී සිටින තැනැත්තන් දෙදෙනා කරන ලද හානි ඉවත් කිරීමට දන්වා ඇති බවත් ඔය සහ ප්‍රධාන මාර්ගය අතර පහත් බිම් කොටස පුරවා ඇති බැවින් ඔයට හානියක් සිදුව තිබේද යන්න මිනින්දෝරුවරයෙකු මගින් මැන එකී වාර්තාව අනුව අවසර පත්‍රය පිළිබඳව තීරණය ගතයුතු බවත් ය.

**පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු :-**

2017.06.12 දින පරීක්ෂණ අවස්ථාවේදී පැමිණිල්ලේ කරුණු දක්වා සිටි පසු ප්‍රාදේශීය ලේකම් ප්‍රකාශ කර ඇත්තේ, අදාල ප්‍රශ්න ගත ස්ථානයේ වාහන සේදීමේ ස්ථානයක් නීති විරෝධී ලෙස පවත්වාගෙන යන බවත් අනවසර ලෙස ඉදිකිරීම් සිදු නොකරන ලෙස දැනුම් දුන්නද එය නොසලකාහැර කටයුතු කිරීම මත වාර්ෂික බදු බලපත්‍රය අහෝසි කළ බවත් ය. මධ්‍යම පරිසර අධිකාරියටද මේ බව දක්වා ප්‍රාදේශීය සභාව වෙත අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට දන්වා ඇති බව ද පෙන්වා දී ඇත. වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය සභාව තවදුරටත් කටයුතු කළයුතු බව ප්‍රාදේශීය ලේකම්ගේ කරුණු දැක්වීම වේ.

2017.06.07 දින ප්‍රාදේශීය ලේකම් එවා ඇති වාර්තාව වෙත අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ ප්‍රාදේශීය සභාව විසින් අනවසරකරු ඉවත් කිරීම කළයුතු බවට කරුණු දක්වා වාර්තා කර ඇති බවය.

2018.02.06 වන දින පරීක්ෂණ අවස්ථාව වනවිටද රක්ෂිතයේ පදිංචිකරුවන් විසින් දිගින් දිගටම අනවසර ඉදිකිරීම් සිදු කරමින් අත්තනගලු ඔයේ පැවැත්මට සිදු කරන හානි අඛණ්ඩව සිදු කරන බව දක්වා ඇත. 2019.05.07 දින පරීක්ෂණ අවස්ථාවේදී පෙන්වා දෙන්නේ ද අනවසරකරු තවදුරටත් එම ස්ථානයේ රැඳී සිටිමින් දිගින් දිගටම අත්තනගලු ඔයට හා එහි රක්ෂිතයට හානි සිදු කිරීමෙන් යාබද පදිංචිකරුවන්ගේ නිවාස පවා හානියකට ලක් වන ආකාරයකට කටයුතු සිදුකර ඇති බවය. මෙම ඉඩමේ රැඳී සිටි තැනැත්තාගේ වාර්ෂික බදු බලපත්‍රය අවලංගු කර ඇති බව අනාවරණය වුවද තවදුරටත් අනවසරකරු ඉවත් කිරීමට කටයුතු කර නොමැති බව පරීක්ෂණ අවස්ථාවේදී අනාවරණය වේ. වාර්ෂික බදු බලපත්‍රය මත රැඳී සිටියදී පරිසරයට හා අත්තනගලු ඔයට හානි නොවන ලෙසට කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් විසින්ද ප්‍රාදේශීය සභාව විසින්ද දිස්ත්‍රික් ලේකම් හා ඉඩම් කොමසාරිස් කාර්යාලය විසින්ද ආදී ලෙස ආයතන ගණනාවක් රක්ෂිතයේ රැඳී සිටි බදුකරුට අවවාද හා උපදෙස් රැසක් ලබාදී තිබියදී ඒවා නොසලකා හරිමින් බදුකරු ක්‍රියා කිරීම මත බලපත්‍රය අවලංගු කළද තවදුරටත් රජයේ දේපලේ රැඳී සිටිමින් හානිදායක ලෙස කටයුතු කරන බව අනාවරණය වේ.

නිරීක්ෂණ හා නිගමන :-

අත්තනගලු ඔය රක්ෂිතයේ රැඳී සිටින තැනැත්තන් දෙදෙනෙකු විසින් මුල් අවස්ථාවේ වාර්ෂික බදු බලපත්‍ර මත රැඳී සිටියද තවදුරටත් පරිසරයට සිදු කරන හානි හා බලපත්‍රයේ කොන්දේසි උල්ලංඝනය කර තිබීම මත බදු බලපත්‍රය අවලංගු කර ඇති බව නිරීක්ෂණය වේ. අත්තනගලු ඔය ශ්‍රී ලංකාවේ ඇළ මාර්ග ඔයවල් ආශ්‍රිත ලේඛන ගත ජල මූලාශ්‍රයකි. මෙම ඔය දෙපස අතිශය සංවේදී පරිසර කලාපයක් පිහිටා ඇති බව ද නිරීක්ෂණය වේ.

රක්ෂිතයේ රැඳී සිටි බලපත්‍රලාභීන් බලපත්‍රය අවලංගු කළ පසු ද ඊට පෙරද දිගින් දිගටම අත්තනගලු ඔයේ පළල ප්‍රමාණය බොහෝ අඩු කරමින් ගල් හා පස් දමා ඇති බවද පෙනී යන අතර, ඉන් මෙම ඔයේ ආවේණික හැඩය හා පාරිසරික සංවේදීතාවයන්ද විනාශ වී ඇති බවද පැමිණිලිකරුවන් ඉදිරිපත් කළ ඡායාරූප හා ලේඛන වෙත අවධානය යොමු කිරීමේදී පෙනී යයි. එමෙන්ම මෙම ඔය දෙපස පදිංචිකරුවන්ගේ දේපළ වලටද හානි සිදුවන ආකාරයට ඔයේ ඉවුරු හා පාංශු ඛාදනය වීමේ අවදානමක්ද පවතින බව පෙනී යයි. මෙම අනවසරකරුවන්ගේ ක්‍රියාකාරකම් ඉවත් කිරීමට වගඋත්තරකරුවන් විසින් කටයුතු කරමින් ගතයුතු නිසි නීතිමය පියවර නොගැනීම අනවසරකරුට දිගින් දිගටම එකී අකටයුතුකම් සිදු කරමින් රැඳී සිටීමට ලබාදෙන ලද අනවශ්‍ය ඉඩ ලබාදීමක් බව ද පෙනී යයි. එමෙන්ම ලේඛන මගින් පමණක් අනවසරකරුගේ ක්‍රියාකාරකම් නැවැත්වීමට වගඋත්තරකරුවන් දැන්වීම් නිකුත් කිරීම ප්‍රමාණවත් නොවන අතර පෙත්සම්කරු පෙන්වා දෙන පරිදි එකී සියළු ක්‍රියාකාරකම් ක්‍රියාත්මක නොවී ඇත්තේ කුමන බලපෑම් මත ද යන්න පිළිබඳ පෙත්සම්කරුට සැකයක් ඇතිව තිබීම සාධාරණ වේ. එමෙන්ම අත්තනගලු ඔය ආශ්‍රිත මෙම ශාඛාව මළ දොළක් බවට පත්වීමට ඉඩ හැරෙන පරිදි කටයුතු සිදුව ඇත්තේ වගඋත්තරකරුවන්ගේ නොසලකා හැරීම මත බව ද පෙන්වා දිය යුතුය. වගඋත්තරකරුවන් නිසි නීතිමය

ක්‍රියාමාර්ග නොගැනීමෙන් අත්තනගලු ඔයට අදාල මෙම සංවේදී පාරිසරික පද්ධතිය විනාශ වීම එම ප්‍රදේශයට පමණක් නොව අත්තනගලු ඔය ආශ්‍රිතව පවතින සමස්ථ පාරිසරික හා භූවිද්‍යාත්මක අගයන්ට හානිදායක ක්‍රියාවකට හේතුවක් වන අතර ඉන් පොදු මහජනතාවගේ පාරිසරික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට හේතුවක් ද වේ.

වගඋත්තරකරුවන් අධිකරණ ක්‍රියාමාර්ග ගනිමින් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු නොකිරීමෙන් පෙත්සම්කරු පෙත්සමෙන් පෙන්වා දී සිටි පරිදි 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව උල්ලංඝනය වීමකට ලක්ව ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය =:

01. ප්‍රාදේශීය ලේකම් විසින් අනවසර පදිංචිකරුවන් දෙදෙනා ඉවත් කිරීමට අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම ඉතා කඩිනමින් සිදු කලයුතු බව ද.

02. ප්‍රාදේශීය සභාව විසින් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කඩිනමින් අධිකරණ නියෝගයක් ලබාගැනීමට ක්‍රියා කළයුතු බව ද.

03. අනවසර රැඳී සිටින්නන් දෙදෙනාට රැඳී සිටීමට බලපත්‍ර ලබාදීමට වගඋත්තරකරුවන් කටයුතු කර තිබී ඇති බැවින් එකී අනවසරකරුවන් රක්ෂිතයේ රැඳී සිටිමින් අත්තනගලු ඔයට සිදු කර ඇති හානි පිළිබඳ පරීක්ෂණයක් සිදු කර නැවත එම පරිසර පද්ධතිය යථා තත්ත්වයට පත් කිරීමට සුදුසු කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතු බවද මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021.06.03 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

වෛ.හේ. නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lan'